# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 පෙබරවාරි මස 28 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 37/73

පෞද්ගලික අංශයේ සියලු ම සේවකයන් සඳහා වාද්ධෝපගත ප්‍රතිලාභ ගෙවීමේ ඒකාකාර ක්‍රමයක් ඇති කිරීම සඳහාත් ඊට ආනුෂංගික හෝ සම්බන්ධ කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

2. (1) නියමිත දිනයේදී හෝ ඉන් පසුව යම් ආරක්ෂිත රැකියාවක සේවකයකු ලෙස පත් වන කිසිම තැනැත්තකු යම් වාද්ධෝපගත ප්‍රතිලාභ ලබා ගැනීමේ කාර්යය සඳහා, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථ සාධක අරමුදල හැර යම් අර්ථසාධක අරමුදලක, විශ්‍රාම වැටුප් අරමුදලක හෝ වෙන යම් වාද්ධෝපගත අරමුදලක හෝ යෝජනා ක්‍රමයක සාමාජිකයකු වීම හෝ එයට දායක මුදලක් ගෙවීම නොකළ යුතු ය.

යම් ආරක්ෂිත රැකියාවක නියුක්ත යම් සේවකයකු විසින් හෝ සේවා යෝජක යකු විසින් සේවක අර්ථ සාධක අරමුදලව හැර වෙන යම් අරමුදලකට කිසිම දායක මුදලක් නොගෙවිය යුතු බව.

(2) නියමිත දිනයේදී හෝ ඉන් පසුව වෙන යම් තැනැත්තකු යම් ආරක්ෂිත රැකියාවක නියුක්ත කර ඇති කිසිම තැනැත්තකු විසින් ඒ සේවකයාට වාද්ධෝපගත ප්‍රතිලාභ සැලසීමේ කාර්යය සඳහා ඒ සේවකයා සම්බන්ධයෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල හැර යම් අර්ථසාධක අරමුදලකට, විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ වෙන යම් වාද්ධෝපගත අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදලක් නො ගෙවිය යුතු ය.

3. නියමිත දිනයේදී හෝ ඉන් පසුව වෙන යම් තැනැත්තකු යම් ආරක්ෂිත රැකියාවක නියුක්ත කර ඇති කිසිම තැනැත්තකු විසින් ඔහුගේ සේවකයන්ට වාද්ධෝපගත ප්‍රතිලාභ සැලසීමේ කාර්යය සඳහා යම් අර්ථසාධක අරමුදලක්, විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ වෙන යම් වාද්ධෝපගත අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් නො පිහිටුවිය යුතු ය.

සේවා යෝජක යකු විසින් කිසිම වාද්ධෝප ගත අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් කිසිම ආරක්ෂිත රැකියාවක නොපිහිටුවිය යුතු බව.

4. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සහ විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

නියෝග.

ඒ 09124—9,197 (71/08)

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන පසු දිනයක හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මණින්, අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතියේ දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නො විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියෝගයක් ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබූ විට එය මෙහි ලා පනවනු ලැබුවාක් මෙන් වලංගුව බලපැවැත්විය යුතු ය. ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

වැරදි සහ දණ්ඩන.

5. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ මේ පනත යටතේ නීත්‍යනුකූලව කරන ලද යම් නියමයක් හෝ දෙන ලද විධානයක් කඩ කරන හෝ පිළිපැදීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

(2) මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තෙක් ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන නඩු විභාගය කින් පසු වරදකරු කරනු ලැබූ විට, හය මාසයක් නො ඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් දහසක් නො ඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

(3) සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නො කරන ලද පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක ඒ වරද කරනු ලැබූ අවස්ථාවෙහි ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරී, ලේකම් හෝ එවැනි වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක් ද ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල් කරුවෙක් ද, තමාගේ කැමැත්ත හෝ වංක සහයෝගය දැක්වීමක් නොමැතිව ඒ වරද කර ඇති බවත් තම කටයුතුවල ස්වභාවය හා එළඹ තිබුණු සියලු කරුණු ගැන සැලකිලිමත්ව තමා විසින් කළ යුතුව තිබුණු පරිදි ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා තිසි සියලු උද්‍යෝගයෙන් ක්‍රියා කළ බවත් ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ වරදට වරදකරු ලෙස සලකනු ලබන්නේ ය.

මේ පනත වෙනත් ලිඛිත නීතියක්, තීරණයක්, සාමූහික ගිවිසුමක් හෝ වෙනත් එකඟවීමක් අභිභවා බල පැවැත්විය යුතු බව.

6. වෙන යම් ලිඛිත නීතියක, තීරණයක, සාමූහික ගිවිසුමක හෝ වෙනත් එකඟවීමක කුමක් සඳහන්ව ඇත ද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර ඒ අනුව, මේ පනතේ විධිවිධාන හා ඒ වෙනත් නීතිය, තීරණය, සාමූහික ගිවිසුම හෝ එකඟවීම හා අතර යම් ගැටුමක් හෝ නො ගැළපීමක් ඇති වුව හොත්, මේ පනතේ විධිවිධාන ඒ වෙනත් නීතිය, තීරණය, සාමූහික ගිවිසුම හෝ එකඟවීම අභිභවා බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

7. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මේ පනතෙහි "ආරක්ෂිත රැකියාව" සහ "සේවකයා" යන්නට 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ දී ඇති අර්ථම පිළිවෙලින් ඇත්තේ ය.